# බෞද්ධ ආර්ථික දර්ශනයට පටහැනිව වර්තමානයේ කෘෂිකර්මාන්තය තුළ කෘමිනාශක භාවිතයේ දී ඇති වී ඇති ගැටලු පිළිබඳ අධ්‍යයනයක්

ඒ. එම්. එන්. ඩී. අත්තනායක, යූ. එල්. එල්. ආර්. උදිතමාලි, පී. ජේ. දර්ශනී[1]

## හැඳින්වීම

බෞද්ධ ආර්ථික දර්ශනය රටක් සුඛිත මුදිත කරලීමට මෙන්ම ශික්ෂණ කැටි සමාජීය පරිසරයක් ගොඩනැගීමටත් හේතු වේ. ලෝකයේ ජීවත් වන ජනයාගේ හා ඔවුන්ගේ ජීවිකාව මැනවින් ගොඩනගා ගැනීමට ආර්ථිකය විශාල බලපෑමක් සිදුකරනු ලැබේ. ඇතැම් රටවල් ආර්ථික කඩා වැටීම මගින් මහත් ව්‍යවසනයන්ට ලක්වන හා ලක් වූ අවස්ථා බහුල වශයෙන් දක්නට ලැබේ. එම නිසා ආර්ථිකමය වශයෙන් සුරක්ෂිත වීම අද ලෝකයේ වැදගත්ම කරුණකි. බෞද්ධ දර්ශනයට අනුව ආර්ථිකය දියුණු කළ යුත්තේ පුද්ගල මානසිකත්වය සමඟිනි. භෞතික වස්තූන් සංවර්ධනයට පෙර ඒක පුද්ගල සංවර්ධනය තුළින් ශක්තිමත් ආර්ථික වර්ධනයක් ළඟා කර ගත හැකි වේ. බුදු දහම සමාජගත ආර්ථික පරිහානිය හෝ දියුණුව ඉතා සරල දෙයක් ලෙසින් නොසලකයි. විශේෂයෙන්ම බුදුන් වහන්සේ ධනය රැස් කළ යුතු ආකාරය දක්වා ඇත්තේ පහත පරිදිය.

"උට්ඨාන විරියාධි ගතා - බාහා බල පරිචිතා
සේදා වක්ඛිත්තා - ධම්මිකා ධම්ම ලද්ධා භෝගා"

(මනුරත්න, 1998).

එනම් උත්සාහයෙන්, වීර්යයෙන් බාහු බලය යොදවමින්, දහඩිය හෙළීමෙන්, ධාර්මික රැකියා වල නිරත වෙමින් ධනය රැස් කළ යුතුය. බුදුරජාණන් වහන්සේ ගිහියන් විසින් නොකළ යුතු මිච්ඡා ආජීවයන් පහක් පිළිබඳව දේශනා කර ඇත. එනම් ආයුධ වෙළදාම, වහල් වෙළදාම, සත්ත්ව ඝාතන ව්‍යාපාර, මත්ද්‍රව්‍ය ව්‍යාපාර සහ විෂ වර්ග ව්‍යාපාරයයි (වාණිජා සූත්‍රයඃ අංගුත්තර නිකාය). ඒ අනුව පුද්ගලයෙකුගේ ආර්ථික ශක්තිය වර්ධනයට අදාළ දැහැමි මාර්ගය කුමක් ද යන්න පෙන්වා දෙන අතර අතීතයේ සිටම දැහැමි ආර්ථිකය තුළ කෘෂිකර්මාන්තය සුවිශේෂී වන නමුත් වර්තමානයේ දී වාණිජකරණය, තරඟය හා තාක්ෂණික දියුණුව අනුව වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා කෘෂි රසායනික යෙදවුම් භාවිතය කැපී පෙනෙන ලක්ෂණයක් බවට පත් වී ඇත. කෘෂිකාර්මික රටක් වන ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තය තුළ පළිබෝධනාශක භාවිතය වර්තමානය වන විට බහුල

---

[1] භූගෝල විද්‍යා අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය, මාතර, ridminiliyanage@gmail.com

වශයෙන් වර්ධනය වී ඇත. ඒ අනුව බෞද්ධ ආර්ථික දර්ශනයෙන් පරිබාහිරව සිදු කරනු ලබන කටයුත්තක් වශයෙන් එය හඳුනාගත හැකිය.

## අධ්‍යයන අරමුණ

සමස්ත බෞද්ධ සමාජයම කෘෂිකාර්මික සමාජයක් වන අතර ධාර්මිකව ධනය ඉපැයීම එහි දී ප්‍රමුඛ වේ. අතීතයේ දී කෘෂි අස්වනු ආරක්ෂා කිරීම සඳහා කෙම් ක්‍රම ආදී සම්ප්‍රදායික පරිසර හිතකාමී ක්‍රම භාවිත කළ නමුත් වර්තමානයේ දී ඒ සඳහා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතා කරයි. ඒ අනුව මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වන්නේ බෞද්ධ ආර්ථික දර්ශනයට පරිබාහිරව වර්තමානයේ කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතය නිසා භූමියට සහ ජීවීන්ට ඇති වී ඇති බලපෑම් අධ්‍යයනය කිරීමයි.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීම සඳහා ප්‍රාථමික මූලාශ්‍ර හා ද්විතියීක මූලාශ්‍ර පාදක කර ගන්නා ලදි. ප්‍රාථමික මූලාශ්‍ර ලෙස ව්‍යුහගත රචනා, සම්මුඛ සාකච්ඡා, ඍජු නිරීක්ෂණ මෙන්ම ප්‍රශ්නාවලි ඉදිරිපත් කරමින් නිවැරදි දත්ත ලබා ගැනීම සිදු කරන ලදි. ද්විතියික මූලාශ්‍ර වශයෙන් පොත්පත්, සඟරා, පර්යේෂණ වාර්තා, සංගණන දත්ත, සිතියම් මෙන්ම අන්තර්ජාලය යන මූලාශ්‍ර උපයෝගි කරගන්නා ලදි. බදුල්ල දිස්ත්‍රික්කයට අයත් හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නෙළුව, මාලිගාතැන්න හා පහළ කටුගහ ග්‍රාම නිලධාරි වසම් තුන අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරාගත් අතර ගොවි පවුල් 100ක නියැදියක් ඔස්සේ ඊට අදාළ දත්ත රැස් කරන ලදි. ඒ සඳහා ව්‍යුහගත ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කළ අතර වගාව සඳහා භාවිත කරන කෘෂි රසායනික ද්‍රව්‍ය, ඒවා යොදන භෝග වර්ග, ඒවා භාවිත කිරීමෙන් භූමියට සහ ජීවීන්ට ඇති වන බලපෑම් යනාදි කරුණු පරීක්ෂා කරන ලදි.


## ප්‍රතිඵල

බෞද්ධ දර්ශනයට අනුව යහපත් ජිවිතයක් සඳහා යෝග්‍ය රැකියා හා කර්මාන්ත ලෙස කෘෂිකර්මාන්තය, සත්ත්ව පාලනය (මස් පිණිස නොවන), රාජ්‍ය සේවය, වෙළදාම (අනුමත නොකළ වෙළඳාම් හැර) යන වර්ගීකරණයට අයත් නොවන රැකියා ජිවන මාර්ග දහස් ගණනක් හඳුනාගත හැකිය. ඒ අනුව කෘෂිකර්මාන්තය යනු ධර්මානුකූල ජිවිකාවක් සඳහා ඇති කර්මාන්තයක් වේ. අතීතයේ සිට කෘෂිකාර්මික රටක් වූ නිසාවෙන් ද පැරණි කෘෂිකර්ම රටාව පිළිබඳ

කතිකාවතක් නිර්මාණය වී ඇති නිසා ද කෘෂිකර්මාන්තය පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත් වේ. බුද්ධ කාලීනව කෘෂිකර්මාන්තය උසස්ම කර්මාන්තයක් ව පැවත ඇත. ධර්මාවබෝධය සඳහා ගිහියන්ට ධර්ම දේශනා කිරීමේ දී බොහෝ අවස්ථාවල බුදුරජාණන් වහන්සේ විසින් උපමා කර තිබෙන්නේ සාමාන්‍ය ජීවිතයේ දී දැක ගත හැකි කරුණුය. මෙහිදී උන්වහන්සේ අවබෝධය පැහැදිලි කර ඇත්තේ කෙතක සිදුවන ක්‍රියාවලියක් තුළිනි. ඒ අනුව එකල කෘෂිකර්මාන්තය අතිශය ධාර්මිකව සිදු කරන ලද කර්මාන්තයක් බව පැහැදිලි කර ඇත. කෘෂිකර්මාන්තය සම්මා ආජීවයක් වුවද වර්තමානයේ දී එම ස්වභාවය බැහැර වී ගොස් ඇත. වාණිජ අපේක්ෂාවන් මත පදනම් වූ කෘෂිකර්මාන්තය තුළින් වක්‍රාකාරයෙන් ප්‍රාණඝාත අකුසලය සිදු වේ.

මෙම අධ්‍යයනයට අනුව බදුල්ල දිස්ත්‍රික්කයේ එළවළු වගාවේ ආරම්භයේ සිට අවසානයේ අස්වැන්න නෙලීම දක්වා කෘෂිරසායනික ද්‍රව්‍ය භාවිත කිරීම තුළ මෙවැනි තත්ත්වයක් හඳුනාගත හැකි විය. මේ ආකාරයට භාවිත කරන කෘෂිරසායනික ප්‍රධාන වශයෙන් කෘමිනාශක, වල්නාශක සහ දිලීර නාශක ලෙස ප්‍රධාන වර්ග තුනක් යටතේ හඳුනාගත හැකි විය. තවද විවිධ කෘමි නාශක වර්ග එක් එක් බෝග සඳහා විවිධ අවස්ථාවන් අනුව භාවිත කරන ආකාරය හඳුනාගත හැකි විය. ඒ අනුව තම කෘෂි අස්වනු ආරක්ෂා කිරීමේ අරමුණ මත පදනම් වෙමින් භාවිත කරනු ලබන කෘෂි රසායනික හේතුවෙන් විවිධ ආකාරයෙන් ජීවීන් සහ ජීවන චක්‍ර කෙරෙහි මෙන්ම පරිසරයට ද සැලකිය යුතු බලපෑමක් එල්ල වී ඇති බව ද හඳුනාගත හැකි විය.

1.1 ප්‍රස්තාරය- කෘෂි රසායනික භාවිතය




මූලාශ්‍රය: ක්ෂේත්‍රීය සමීක්ෂණය 2017

**1.2 වගුව එක් වගා කන්නයක් සඳහා පළිබෝධනාශක භාවිතය**

| ග්‍රාම නිලධාරි වසම | වාර ගණන | | | | | |
|---|---|---|---|---|---|---|
| | 4 වරක් | | 5-8 | | 9 වැඩි | |
| | සංඛ්‍යාව | ප්‍රතිශතය % | සංඛ්‍යාව | ප්‍රතිශතය % | සංඛ්‍යාව | ප්‍රතිශතය % |
| නෙළුව | 9 | 21 | 14 | 30 | 3 | 19 |
| මාලිගාතැන්න | 7 | 17 | 18 | 39 | 4 | 25 |
| පහළ කටුගහ | 26 | 62 | 14 | 30 | 9 | 56 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය 2017

මේ අනුව ප්‍රදේශයේ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් වගාවක් සඳහා වාර 5-8 පමණ දක්වා කෘමි නාශක භාවිත කරනු ලබයි. ඒ අනුව එම වාර ග්‍රාම නිලධාරි වසම්වල ප්‍රතිශතයන් වෙන් වෙන් වශයෙන් ගත් විට නෙළුව ග්‍රාම නිලධාරි වසමේ 30%ක් ද මාලිගාතැන්න ග්‍රාම නිළධාරී වසමේ 39%ක් ද පහළ කටුගහ ග්‍රාම නිළධාරී වසමේ 30%ක් ද වේ. ඉහත දත්තයන් අනුව කෘෂි රසායන බහුලව ලෙස භාවිත කිරීමෙන් පෙනීයන්නේ අස්වැන්න වැඩි කර ගනිමින් ඉහළ ලාභයක් උපයා ගැනීමේ පරමාර්ථයන් මත මෙම ක්‍රියාවලි සිදු කරන බවය. මේ අනුව අධ්‍යයනයට ලක් වූ ගොවීන්ගෙන් වැඩි ප්‍රමාණයක් බෝග වලට හානි සිදු වීමට පෙර සිටම කෘමිනාශක භාවිත කරන බව ද පැහැදිලි වේ. ඒ අනුව කෘමිනාශක භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස සත්ව ප්‍රාණඝාතය බහුලව සිදු වී ඇති බව හඳුනාගත හැකිය.

## නිගමන

බුද්ධ දේශනයට අනුව අල්ප වූ ආශාවන් වලින් යුක්ත වීම සහ ලද දෙයින් සතුටු වීම උතුම් ගුණාංගයන් වේ. පරිභෝජනයේ දී මෙන්ම නිෂ්පාදනයේ දී මෙම උතුම් ගුණාංග අනුගමනය කිරීම වැදගත් වේ. එසේම යමෙකු තම පවුල පෝෂණය කිරීම සඳහා ධාර්මිකව ධනය ඉපැයිය යුතු ය. තම මූලික අවශ්‍යතා අතික්‍රමණය කරමින් අසීමිත ධනය රැස් කිරීම ධාර්මික නොවේ. අතීතයේ සිට පරිසර හිතකාමී ලෙසත් සෞඛ්‍යයට හානි නොවන ලෙසත් කෘෂිකර්මාන්තය පැවතියේ එකල ජනයාට සරල ජීවන ක්‍රමයක් පැවති බැවිනි. නමුත් වර්තමානය වන විට බහුවිධ

අරමුණු කරා හඹා යන ජනතාව තම අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බෞද්ධ දර්ශනයට අනුකූල නොවන ක්‍රියාවන්ට යොමු වී ඇත. ඒ අනුව වර්තමානයේ ජනයා තම ආර්ථික වර්ධනය උදෙසා කෘමිනාශක භාවිත කරමින් වැඩි අස්වැන්නක් ලබා ගැනීමට කටයුතු කරයි. එම ක්‍රියාවන් ඔස්සේ භූමිය මෙන්ම සත්ත්ව ජීවිත ද අද වන විට අවධානමකට ලක් ව ඇති බවට නිගමනය කළ හැකි වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ

ඤාණසුමන හිමි, දේල්දූවේ. (2006), *ආදී බෞද්ධ දර්ශනයේ මූල දර්ශනය,* කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කුලරත්න මාවත.

ගල්මන්ගොඩ, සුමනපාල. (1994), *ආදී බෞද්ධ දර්ශනය,* අභය මුද්‍රණ ශිල්පීයෝ සහ ප්‍රකාශකයෝ.

ධම්මතිලක හිමි, පැලවත්තේ. (2010), *බෞද්ධ දර්ශනය.* සරසවි ප්‍රකාශකයෝ.

*මිලිඳපඤ්හ.* (1962), (සංස්.) බලංගොඩ ආනන්ද මෛත්‍රී නා හිමි

විජේරත්න, එම්. (2006), *පළිබෝධනාශක භාවිතයේ ප්‍රතිවිපාක සහ ප්‍රයෝගික විසඳුම්.* හොරණ: ගෝල් ප්‍රින්ටර්ස් පුද්ගලික සමාගම.